# මුදල්, බැංකු හා මිල මට්ටම

දේශාන් අබේගුණවර්ධන

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

### ආවරණය වන උපමාතෘකා

1. මුදල්
2. මූල්‍ය පද්ධතිය
3. මූල්‍ය ප්‍රතිපත්තිය
4. බැංකු පද්ධතිය
5. මිල මට්ටම හා උද්ධමනය

## 1. මුදල්

වර්තමාන සමාජය මුදල් භාවිතයට ගැනීමට පෙර කාලයේදී, ස්වයංපෝෂිත ක්‍රමය අවසන්ව භාණ්ඩ හුවමාරු ක්‍රමය ඇරඹිණ.

### භාණ්ඩ හුවමාරු ක්‍රමයේ දුර්වලතා

1. ද්වික සමපාතයක් නොතිබීම.
2. නිශ්චිත හුවමාරු අනුපාතයක් නොතිබීම.
3. වටිනාකම් මැනීමේ පවත්නා අපහසුතා
4. කුඩා කොටස් වලට බෙදීම අපහසු වීම
5. රැගෙන යාමේ අපහසුතාවය
6. ගබඩා කර තබා ගැනීමේ අපහසුතාවය
7. සේවාවක් හුවමාරු කර ගැනීමට අපහසු වීම
8. ආර්ථික ප්‍රසාරණයට බාධා ඇති වීම

   ඉහතින් සඳහන් කල භාණ්ඩ හුවමාරු ක්‍රමයේ පැවති දුර්වලතා හේතු කරගෙන මුදල් ක්‍රමය සමාජය තුළ ප්‍රචලිත විය.

### මුදල් යනු,

හුවමාරු මාධ්‍යයක් ලෙස පොදුවේ පිළිගන්නා ඕනෑම දෙයකි

### මුදලේ කාර්යයන්

මුදලේ කාර්යයන් පහත පරිදි පෙළ ගැස්විය හැක.

1. විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම

   එනම්, පොදු විනිමය මාධ්‍යයක් වෙමින්, භාණ්ඩ හා සේවා හුවමාරුව කාර්යක්ෂම කෙරෙන පදනම සැපයීමයි. මෙතුලින් භාණ්ඩ හුවමාරු ක්‍රමයේ ප්‍රධාන දුර්වලතා මඟහැරෙන අතර කාර්යක්ෂම හුවමාරු ක්‍රමයක් නිර්මාණය වේ.

2. ගිණුම් ඒකකයක් ලෙස ක්‍රියා කිරීම

   එනම්, භාණ්ඩ හා සේවාවල වටිනාකම මැනීමේ පොදු මාධ්‍යය ලෙස මුදල් භාවිතා කිරීමයි. එය භාණ්ඩයක / සේවාවක මිලෙන් ප්‍රකාශ කෙරෙන අතර එය මුදලින් මැන දක්වයි.

3. වටිනාකමේ සන්නිධියක් ලෙස ක්‍රියා කිරීම.

   එනම්, පුද්ගලයෙක්ට තම වර්තමාන පරිභෝජනය කැප කර, එය අනාගත පරිභෝජනය සඳහා රැස් කිරීමට මුදල් භාවිත කල හැකි බව මෙයින් ප්‍රකාශ කෙරේ.

4. විලම්භිත ගෙවුම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

එනම්, වර්තමානයේ සිදු කරන ණය ගණුදෙණු, අනාගතයේදී මුදල් මාධ්‍යය කරගෙන පියවීමේ හැකියාවයි.

නැතහොත් වර්තමානයේ සිදු කරනු ලබන භාණ්ඩ හා සේවා හුවමාරු කිරීම්, අනාගත භාණ්ඩ හා සේවා හුවමාරු කිරීම සඳහා පහසු කරලීම මෙයින් අර්ථ ගන්වයි.

### මුදලේ කාර්යයන් ඉටු කිරීමට ඇති බාධා

1. උද්ධමනය සමඟ මුදලේ අගය අඩු වීම.
2. මුදල් ලඟ තබා ගැනීමේ අවධානම.
3. මුදලේ ආවස්ථික පිරිවැයක් පැවතීම.
4. මුදල් වලට වඩා පහසු මාධ්‍යයන්හි සුලභතාවය.
5. තාක්ෂණික දියුණුව.

### හොඳ මුදලක ලක්ෂණ

- පොදු පිළිගැනීම
- සමජාතීය වීම
- කුඩා කොටස් වලට බෙදිය හැකි වීම
- වටිනාකම වෙනස් නොවී පැවතීම
- කල් පැවතීම
- අනුකරණය දුෂ්කර වීම
- සුලභ හෝ දුලභ නොවීම
- පහසුවෙන් රැගෙන යා හැකි වීම

### මුදල් වර්ග

**1. ව්‍යවහාර මුදල්**

- නෛසර්ගික වටිනාකමක් නොමැති

  මුහුණත වටිනාකමක් උදෙසා මූල්‍ය අධිකාරීන් නිකුත් කරන කාසි හා නෝට්ටු ව්‍යවහාර මුදල් ලෙස හැඳින්වේ.

**2. බැංකු මුදල්**

- චෙක්පත් යොදා ගනිමින් ගණුදෙණු කළ හැකි ඉල්ලුම් තැන්පතුවල ඇති මුදල් වේ.
- මේවා ඉහළ ද්‍රවශීලතාවයෙන් යුක්ත වේ.

**3. ආසන්න මුදල්**

- හුවමාරු මාධ්‍යයක් ලෙස ක්‍රියා නොකරන
- එහෙත් වටිනාකමේ සන්නිධියක කාර්යය ඉටු කරන
- ඉහළ ද්‍රවශීලතාවයකින් යුත් මුදල් ආසන්න මුදල් ලෙස හැඳින්වේ.

  උදා: ඉතුරුම් තැන්පතු, කාලීන තැන්පතු


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

### 4. මුදල් ආදේශක

- වටිනාකමේ සන්නිධියක කාර්යය ඉටු නොකරන
- එහෙත් තාවකාලික හුවමාරු මාධ්‍යයක් වශයෙන් ක්‍රියාකරන උපකරණ, මුදල් ආදේශක ලෙස හඳුන්වයි.

  උදා: ණය කාඩ්පත්, හරපත්

### 5. විද්‍යුත් මුදල්

- මුදල්, විද්‍යුත් ක්‍රමය භාවිතා කර ගබඩා කොට තබා මෘදුකාංගයක් මගින් ගණුදෙණු සඳහා යොදා ගන්නා ක්‍රමවේදය, විද්‍යුත් මුදල් නම් වේ.
  උදා: E banking, Easy Cash

**විද්‍යුත් මුදල් භාවිතා කළ හැකි විවිධ අවස්ථා කිහිපයකි.**

- එකම ආයතනයේ ගිණුම් දෙකක් අතර මුදල් මාරු කිරීමට
- පුද්ගලයෙක් විසින් තවත් පුද්ගලයෙක්ට ගෙවීම් කිරීමට
- බිල්පත් සඳහා ගෙවීම් කිරීමට
- එකම ආයතනයේ හෝ බාහිර ආයතනයක ඇති අනෙකුත් ගිණුම් වලට මාරු කිරීමට
- කොටස් වෙළඳපොලට මුදල් මාරු කිරීමට

**විද්‍යුත් මුදල් භාවිතා කිරීමට හේතු වන්නේ,**

- පහසුවෙන් හා ඉක්මණින් ගෙවීම් සිදු කළ හැකි වීම
- ජාත්‍යන්තර ගණුදෙණු සිදු කළ හැකි වීම
- භෞතික මුදල් වලට වඩා ආරක්ෂාකාරී වීම
- වාණිජ ආයතන අතර පවත්නා තරඟකාරීත්වය නිසා

**විද්‍යුත් මුදල් භාවිතයේ වාසි හා අවාසි**

**වාසි**

- රැගෙන යාම හා භාවිතය පහසු වීම
- අවධානම අඩු වීම
- ගෙවීම් පියවීම් ඉක්මන් වීම හා කාලය ඉතිරි වීම
- ඉහල සමාජ පිළිගැනීම
- ලෝකයේ ඕනෑම තැනකින් ගෙවීම් සිදු කිරීමට භාවිතා කළ හැකි වීම

**අවාසි**

- තවකෙකුට පැවරිය නොහැකි වීම
- නෛතික පිළිගැනීමේ අඩු බව
- ඉක්මණින් යල් පැන යාම
- තාක්ෂණික ගැටළු
- ඉතා පුළුල්ව ව්‍යාප්ත වූ තොරතුරු තාක්ෂණයක් අත්‍යාවශ්‍ය වීම


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd


## මුදල් ඉල්ලුම / ද්‍රවශීලතාවරණය

මුදල් සඳහා ඇති ඉල්ලුම ප්‍රධාන සාධක මත රඳා පවතී.

1. ගණුදෙනු චේතනාව
2. ආරක්ෂණ චේතනාව
3. සම්පේක්ෂණ චේතනාව


### 1. ගණුදෙණු චේතනාව

මින් අදහස් කරන්නේ පුද්ගලයන් එදිනෙදා ගණුදෙණු කිරීම සඳහා යෙදවීමට තමන් සතු වත්කම් වලින් කොටසක් මුදල් වශයෙන් ලඟ තබා ගන්නා බවයි. එයට හේතුව ගණුදෙණු සඳහා මුදල් සෘජුවම භාවිතා කළ හැකි වීමයි.





### 2. ආරක්ෂණ / පුරවාරක්ෂණ චේතනාව

එනම් හදිසි ආපදාවකදී, ප්‍රයෝජනයට ගැනීම සඳහ මුදල් ලඟ තබා ගැනීමට දක්වන කැමැත්තයි. මෙවැනි අවස්ථා වලදී එවැනි ආපදාවකට මුහුණ දීම සඳහා තම වත්කම් වලින් කොටසක් මුදලින් ලඟ තබා ගනී.




### 3. සමපේක්ෂණ චේතනාව

පිලිණපත්වල මුදල් ආයෝජනය කිරීම තුලින් අනාගත ප්‍රතිලාභ ලබා ගැනීමේ අරමුණින් මුදල් ශේෂ ලඟ තබා ගැනීමයි.
පොලී අනුපාතය හා සමපේක්ෂණ චේතනාව මත මුදල් ඉල්ලුම අතර ප්‍රතිලෝම සම්බන්ධයක් පවතී.




JMC vLearning "your virtual learning partner"


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

### මුදලට ඇති ඉල්ලුම තීරණය කරන සාර්ව ආර්ථික විචල්‍යයන්

මූර්ත ආදායම

පොලී අනුපාතය

මිල මට්ටම

අනාගත අපේක්ෂා

ආයතනික සාධක

මූල්‍ය වෙළඳපොල නව්‍යතා

### මුදල් සැපයුම

යනු, නිශ්චිත අවස්ථාවකදී ගණුදෙණු සඳහා මහජනයා අත සංසරණය වන මුදල් ප්‍රමාණය වේ. මෙයට අයත් ප්‍රධාන කොටස් 03 කි.

1. ව්‍යවහාර මුදල්
2. ආසන්න මුදල්
3. බැංකු මුදල

මුදල් සැපයුම ප්‍රධාන ප්‍රභේද කිහිපයක් යටතේ සාකච්ඡා කෙරේ.

#### 1. පටු මුදල් සැපයුම (M1)

කිසියම් නිශ්චිත අවස්ථාවක මහජනයා සතුව පවතින ව්‍යවහාර මුදල් හා ඉල්ලුම් තැන්පතුවල එකතුවයි.

$M_1$ = මහජනතාව සතු ව්‍යවහාර මුදල් + මහජනයා සතු වාණිජ බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතු

#### 2. පුළුල් මුදල් සැපයුම ($M_2$)

මහජනයා සතු ව්‍යවහාර මුදල්, මහජනයා සතු වාණිජ බැංකුවල ඉල්ලුම් තැන්පතු හා මහජනයා සතු වාණිජ බැංකුවල තිබෙන කාලීන හා ඉතුරුම් තැන්පතුවල එකතුව පුළුල් මුදල් සැපයුමට අයත් වේ.

$M_2$ = $M_1$ + මහජනයා සතු වාණිජ බැංකුවල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතු

#### 3. ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ($M_{2b}$)

මෙහිදී, මහජනයා සතු වාණිජ බැංකුවල තිබෙන අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ශේෂයක් සහ වාණිජ බැංකුවල තිබෙන මහජනයා සතු නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ශේෂයන් එක්ව ගණනය කරයි.

$M_2b$ = $M_2$ + අනේවාසික විදේශ ව්‍යාවහාර මුදල් ගිණුම්වල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතු + නේවාසිකයන් සතු විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතු

#### 4. වඩාත් පුළුල් මුදල් සැපයුම ($M_4$)

යම් නිශ්චිත අවස්ථාවක, ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුමට, බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ඇති මහජනතාව සතු ඉතුරුම් හා කාලීන තැන්පතු සහ ලියාපදිංචි මූල්‍ය සමාගම්වල ඇති  මහජනතාව සතු ඉතුරුම් හා කාලීන තැන්පතු එකිණීමෙන් ,වඩාත් පුළුල් මුදල් සැපයුම, සකස් කෙරේ.

JMC vLearning
© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

$M_4$ = $M_{2b}$ + බලපත්‍රලාභී විශේෂිත බැංකුවල මහජනයා සතු කාලීන ඉතුරුම් තැන්පතු + ලියාපදිංචි මූල්‍ය සමාගම්වල මහජනයා සතු කාලීන හා ඉතුරුම් තැන්පතු

### මුදල් සැපයුම තීරණය කරන සාධක

1. බැංකු ක්‍රමය සතු ශුද්ධ දේශීය වත්කම්
2. බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශ වත්කම්
3. බැංකු ක්‍රමය සතු අනෙකුත් ශුද්ධ වත්කම්

### පදනම් මුදල් / අධි බලැති මුදල්

- කිසියම් රටක සමස්ත මුදල් සැපයුමට පදනම සපයන මූල්‍ය වත්කම් මුදල් පදනම ලෙස හැඳින්විය හැක.
- මෙහි ප්‍රධාන සංරචක 04 කි.

- මහජනයා සතු ව්‍යවහාර මුදල්
- වාණිජ බැංකු සතු ව්‍යවහාර මුදල්
- වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වා ගෙන යන තැන්පතු
- රාජ්‍ය නියෝජිත ආයතන විසින් මහ බැංකුවේ පවත්වා ගෙන යන තැන්පතු

වෙනත් ආකාරයකට දැක්වුවහොත් පදනම් මුදල් යනු මහ බැංකුවට කාසි හා නෝට්ටු ස්වරූපයෙන් මහජනයා සහ වාණිජ බැංකු කෙරෙහි ඇති වගකීමයි.

මේවා සංචිත මුදල් ලෙස ද හැඳින්වේ.

## 2. මූල්‍ය පද්ධතිය

ආර්ථික කාරක ඒකකයන්ගේ මූල්‍ය තීරණ ක්‍රියාත්මක කරන වෙළඳපොළවල්, මූල්‍ය පනත, මූල්‍ය උපකරණ සහ මූල්‍ය යටිතල පහසුකම් යානදියේ එකතුවක් ,මූල්‍ය පද්ධතියක්, ලෙස හැඳින්වේ.

මූල්‍ය පද්ධතියක් පහත සංරචකයන්ගෙන් සමන්විතය.

1. මූල්‍ය ආයතන
2. මූල්‍ය වෙළඳපොල
3. මූල්‍ය උපකරණ
4. මූල්‍ය යටිතල පහසුකම්
5. මූල්‍ය ආයතන අධීක්ෂණය කරන නියාමන ආයතන

### 1. මූල්‍ය ආයතන

- විවිධ මූල්‍ය උපකරණ ආශ්‍රිතව ගණුදෙණුවල යෙදී සිටිමින් විවිධ මූල්‍ය සේවාවන් සපයන මූල්‍ය ආයතන නම් වේ.
- මූල්‍ය ආයතන ප්‍රධාන කොටස් 02 කි.

- අතරමැදි මූල්‍ය ආයතන
- මූල්‍ය සේවා සපයන ආයතන

### අතරමැදි මූල්‍ය ආයතන

- අතිරික්ත මුදල් ඇති ඒකක වලින් ඉතුරුම් ලෙස ලබා ගනිමින්, අරමුදල් හිඟ ඒකකයන්ට එම ඉතුරුම් ණය ලෙස ලබා දී ලාභ උපයා ගැනීම සිදු කරන මූල්‍ය ආයතන ,අතරමැදි මූල්‍ය ආයතන, ලෙස හඳුන්වයි.




- ශ්‍රී ලංකාවේ අතරමැදි මූල්‍ය ආයතන පහත දැක්වේ.
- රක්‍ෂණ සමාගම්
- ඒකක භාර
- කල් බදු සමාගම්
- වාණිජ බැංකු
- බලපත්‍රලාභී විශේෂිත බැංකු
- ලියාපදිංචි මූල්‍ය සමාගම්
- ආයෝජන සමාගම්

### මූල්‍ය සේවා සපයන ආයතන

- මහජනතාවට හා ව්‍යාපාර ආයතන වලට මූල්‍ය වෙළඳපොලේ සිදුවන ගණුදෙණු කාර්යක්‍ෂම පවත්වා ගෙන යාමට අවශ්‍ය සේවා සපයන ආයතන මූල්‍ය සේවා සපයන ආයතන ලෙස හැඳින්වේ.
- ශ්‍රී ලංකාව තුළ මූල්‍ය සේවා සපයන ආයතන කිහිපයක් දැක්විය හැක.


- වාණිජ බැංකු
- අරමුදල් කළමනාකරණ ආයතන
- මුදල් තැරැව්කාර ආයතන
- ආණ්ඩුවේ සුරැකුම්පත් පිළිබඳ ප්‍රාථමික වෙළඳුන්

## 2. මූල්‍ය වෙළඳපොල

- කෙටිකාලීන හා දිගුකාලීන අරමුදල් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මූල්‍ය උපකරණ මිලට ගැනීම හා විකිණීම සිදු කරන සමස්ත වෙළඳපොල මූල්‍ය වෙළඳපොලේ ලෙස හඳුන්වයි.

JMC vLearning
"your virtual learning partner"


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd




**මුදල් වෙළඳපොල**

- වසරක් හෝ වසරකට වඩා අඩු කාලයක් තුළ පරිණත වන භාණ්ඩාගාර බිල්පත්, වාණිජ පත්‍රිකා හා තැන්පතු සහතික වැනි පොලී උපයන කෙටි කාලීන වත්කම් වෙළඳාම සිදුවන වෙළඳපොළයි.
- මුදල් වෙළඳපොලේ උප වෙළඳපොල වර්ග කිහිපයකි.

- අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළඳපොල
- භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොල
- වාණිජ පත්‍රිකා වෙළඳපොල

**ප්‍රාග්ධන වෙළඳපොල**


- වසරකට වඩා වැඩි කාලයකදී පරිණත වන භාණ්ඩාගාර බැඳුම්කර, සාංගමික බැඳුම්කර වැනි පොලී උපයන දිගු කාලීන වත්කම් වෙළඳාම සිදුවන වෙළඳපොළයි.
- ප්‍රාග්ධන වෙළඳපොල ප්‍රධාන උප වෙළඳපොලවල් 03 කින් සමන්විත වේ.
  - භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොල
  - සාංගමික බැඳුම්කර වෙළඳපොල
  - කොටස් වෙළඳපොල

## 3. මූල්‍ය උපකරණ

මූල්‍ය වෙළඳපොල තුල ගණුදෙණුවන මූල්‍ය උපකරණ ප්‍රධාන වශයෙන් පහත පරිදි පෙළ ගැස්විය හැක.

JMC vLearning "your virtual learning partner"


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd




### 4. මූල්‍ය යටිතල පහසුකම්

- මේ යටතට පහත දෑ දැක්විය හැක.
  - චෙක්පත් නිශ්කාශන පද්ධතිය
  - අරමුදල් පැවරුම් පද්ධතිය
  - තත්කාලීන දළ පියවීම් පද්ධතිය
  - නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතිය

### 5. මූල්‍ය ආයතන අධීක්ෂණය කරන නියාමන ආයතන

- මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව ආරක්ෂා කර ගැනීම සඳහා අණපණත් හා රේගුවේ කටයුතු ඉටු කිරීමට රජය විසින් ස්ථාපිත කර ඇති ආයතන මූල්‍ය අධීක්ෂක හා නියාමන ආයතන වේ.
- ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන නියාමන ආයතන ලෙස,
  - ශ්‍රී  ලංකා මහ බැංකුව
  - සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව
  - ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය

  දැක්විය හැක.


## 3. මූල්‍ය ප්‍රතිපත්තිය

- ආර්ථික හා මිල ස්ථායිතාවය හා මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාවය යන අරමුණු මුදුන් පමුණුවා ගැනීමට පොලී අනුපාතය හා මුදල් සැපයුම කෙරෙහි බලපෑම් කිරීමට මූල්‍ය උපකරණ හැසිරවීමේ ක්‍රියාවලියයි.


JMC vLearning "your virtual learning partner"


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

- මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ පහත පරිදි පෙළ ගැස්විය හැක.





- **මහ බැංකු පොලී අනුපාතය**
  - මහ බැංකුව, වාණිජ බැංකු වලට ලබා දෙන ණය වෙනුවෙන් අය කරන පොලී අනුපාතය වේ.




- **ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය**
  - වාණිජ බැංකු විසින් තම තැන්පතු ප්‍රමාණයෙන් යම් ප්‍රතිශතයක් අතැති මුදල් හා බැංකු මුදල් ලෙස ළඟ තබා ගත යුතු බවට මහ බැංකුව විසින් නියෝග එවා ඇත. එම ළඟ තබා ගත යුතු සංචිතය, සමස්ත තැන්පතු ප්‍රමාණයේ අනුපාතයක් ලෙස සලකා බැලූ විට ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ගණනය කළ හැක.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd




- විවට වෙළඳපොල කටයුතු
  - විවෘත වෙළඳපොල තුල සුරැකුම්පත් මිලට ගැනීම හා විකිණීම සිදුවන වෙළඳපොලයි.




## 4. බැංකු පද්ධතිය

ඕනෑම ආර්ථිකයක, බැංකු පද්ධතිය, ඉතාමත් වැදගත් මෙන්ම බොහෝ ආර්ථික කටයුතු වලට බලපෑමක් ඇති කල හැකි කාර්යභාරයන් ඉටු කරයි. රටක ආර්ථික ස්ථාවරත්වය ගොඩ නැංවීමේලා ප්‍රධාන කාර්යභාරයන් බැංකු පද්ධතිය මඟින් ඉටු කරනු ලබයි.

### මහ බැංකුව

රටක මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා මූලිකත්වය ගෙන කටයුතු කරමින්, රටේ සියළු වාණිජ බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතනයන්ට නායකත්වය සපයමින්, මූල්‍ය පද්ධතියේ සඵලදායී ක්‍රියාකාරීත්වය සඳහා වග කියනු ලබන ප්‍රධාන බලධාරී ආයතනය මහ බැංකුවයි. වර්තමානයේ සෑම ස්වෛරී රාජ්‍යයකම මහ බැංකුවක් දක්නට ලැබෙන අතර එය රටක ස්වෛරීභාවයේ සංකේතයක් වශයෙන් ද සලකනු ලබයි.

### මහ බැංකුවේ අරමුණු

ශ්‍රී ලංකා මහ බැංකුව සතු මූලික අරමුණු 02 කි.

1. ආර්ථික හා මූල්‍ය ස්ථායිතාවය පවත්වා ගෙන යාම.
2. මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාවය පවත්වා ගෙන යාම.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

මහ බැංකුවේ කාර්යයන්

ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් පහත පරිදි පෙල ගැස්විය හැක.

1. මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙය වීම.
2. ව්‍යවහාර මුදල් නිකුත් කිරීම හා බෙදා හැරීම.
3. රාජ්‍ය ණය කළමනාකරණය.
4. නිල විදේශ සංචිත කළමනාකරණය.
5. විනිමය අනුපාත ප්‍රතිපත්තිය මෙහෙය වීම.
6. රජයේ උපදේශන බැංකුකරු ලෙස ක්‍රියා කිරීම.
7. සේවක අර්ථ සාධක අරමුදල කළමනාකරණය හා පරිපාලනය.
8. නියෝජ්‍යාතන කටයුතු.
9. ග්‍රාමීය ණය යෝජනා වැඩ සටහන් පවත්වා ගෙන යාම.

බලපත්‍රලාභී වාණිජ බැංකු

- චෙක්පතකින් හෝ විධායකයකින් ඉල්ලූ විටෙක ආපසු ගෙවීමේ පොරොන්දුවට යටත්ව මහජනයාගේ මුදල් තැන්පතු භාර ගැනීම විශේෂ කාර්යය කොටගත් ලාභ ලැබීමේ පරමාර්ථයෙන් මූල්‍ය අතරමැදිකරු සේ නියුක්තව සිටින මූල්‍යාතන ,වාණිජ බැංකු, ලෙස හඳුන්වයි.
- වාණිජ බැංකුවල කාර්යයන් පහත පරිදි පෙළගැස්විය හැක.
  - ඉල්ලුම්, ඉතුරුම් හා කාලීන තැන්පතු පවත්වාගෙන යාම.
  - කෙටිකාලීන ණය ලබා දීම.
  - ණය හා අත්තිකාරම් ලබා දීම.
  - නියෝජිත සේවා සැපයීම.
  - පොදු උපයෝගිතා සේවා සැපයීම.
- වාණිජ බැංකුවක ප්‍රධාන අරමුණු 02 කි.
  - මහජන විශ්වාසය ආරක්ෂා කර ගැනීම සඳහා ද්‍රවශීලතාවය පවත්වා ගෙන යාම.
  - තැන්පත්කරුවන් ආකර්ශනය කර ගැනීම සඳහා ලාභදායීත්වය පවත්වා ගෙන යාම සහ ඉහළ නැංවීම.

## 5. මිල මට්ටම හා උද්ධමනය

- ප්‍රධාන වශයෙන් මෙහිදී මිල මට්ටම් 03 ක් සාකච්ඡා කෙරේ.
  1. නිරපේක්ෂ මිල

     භාණ්ඩයක හෝ සේවාවක වෙළඳපොල මිල මෙනමින් හඳුන්වයි.
  2. සාපේක්ෂ මිල

     භාණ්ඩ මිල ගණන් අතර අනුපාතය මෙයින් හඳුන්වයි.
  3. පොදු මිල මට්ටම

     සියළුම භාණ්ඩ හා සේවාවල නිරපේක්ෂ මිල ගණන්වල සාමාන්‍ය අගය වේ.

     පොදු මිල මට්ටමේ වෙනස්වීම් භාවිතයෙන් ප්‍රධාන සංකල්ප 03 ක් සාකච්ඡා කෙරේ.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

- උද්ධමනය

  පොදු මිල මට්ටමේ හට ගන්නා අඛණ්ඩ වැඩි වීමයි.

- අවධමනය

  පොදු මිල මට්ටමේ හට ගන්නා අඛණ්ඩ පහළ යාමයි.

- නිරුද්ධමනය

  උද්ධමන අනුපාතයේ අගය ක්‍රමයෙන් අඩු වීමයි.

## උද්ධමන වර්ග

1. ප්‍රසර්ජන / මධ්‍යස්ථ උද්ධමනය

   දිගුකාලයක් තිස්සේ මධ්‍යස්ථ වේගයකින් සිදුවන උද්ධමනයයි. මෙහිදී උද්ධමන අනුපාතය 5% කට වඩා අඩු වේ.

2. ජවන උද්ධමනය

   එනම් අතිශයින් ඉහළ වේගයකින් හටගන්නා උද්ධමනයයි. මෙහිදී උද්ධමන අනුපාතය 20%, 100%, 2000 වැනි ඉලක්කම් දෙකේ හෝ තුනේ සංඛ්‍යාවකින් ගනු ලබයි.

3. අති උද්ධමනය

   - මාසිකව 50% ක් තරම් වේගයකින් පොදු මිල මට්ටම ඉහළ යාමේ ස්වභාවයයි.
   - මෙයට ප්‍රධාන හේතුව මුදල් සැපයුමේ වේගවත් ප්‍රසාරණයයි.

4. සර්පිල උද්ධමනය

   - පොදු මිල මට්ටම දගරයක් ආකාරයට හෙවත් සර්පිලයක් ආකාරයට ඉහළ යාමයි.
   - මෙයට හේතුවන්නේ, උද්ධමනයකදී ව්‍යාපාර ලාභ ඉහළ යාම හේතුවෙන් සාධක සඳහා ඉල්ලුම වැඩි වී සාධක මිල වැඩි වීමයි. මෙය ක්‍රියාවලිය දගරයක් ආකාරයෙන් සිදු වේ.

5. මර්ධිත උද්ධමනය
   - මෙහිදී උද්ධමනය, රජය විසින් මැදිහත් වීම තුළින් මර්ධනයට ලක් කිරීම සිදු කරයි.
   - මිල පාලනයන්, සලාකනය, වැටුප් අනුපාත නියම කිරීම වැනි ක්‍රියා මාර්ග මෙහිදී යොදා ගැනේ.

## උද්ධමනයට හේතු


උද්ධමනයට හේතු 02 කි.

1. ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය
2. පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය

1. ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය


- සීමිත භාණ්ඩ ප්‍රමාණයක් පසුපස හඹායන අති විශාල මුදල් ප්‍රමාණයක්, යන යෙදුමෙන් මෙය    දැක්විය හැකියි.
- සමස්ත ඉල්ලුම සමස්ත සැපයුමට වඩා වැඩි වේගයකින් වැඩි වන විට මිල ඉහල යාමේ ප්‍රවනතාවය .ඉල්ලුමේ ඇදුනු උද්ධමනයයි, ලෙස දැක්විය හැක.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd




2. පිරිවැයෙන් තල්ලුවුනු උද්ධමනය

- මෙය සැපයුම් අංශයෙන් ඇරඹෙන අතර, සාමාන්‍යයෙන් නිෂ්පාදන පිරිවැය වැඩිවීම නිසා මෙම උද්ධමනය ඇති වේ.
- මෙයට හේතුව ලෙස,
  වෘත්තීය සංගම් නිසා වැටුප් වැඩි වීම
  නියං / ගංවතුර නිසා සැපයුමට බලපෑම
  යෙදවුම් මිල ඉහල යාම
  දැක්විය හැක.





© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

### උද්ධමනයේ ප්‍රතිවිපාක

උද්ධමනය තුලින් ආර්ථිකයේ විවිධ පාර්ශව වෙත පහත පරිදි බලපෑම් ඇති කරනු ලැබේ.

1. මූර්ත පොලී අනුපාතය සෘණ වීමෙන් ඉතුරුම් අධෛර්යමත් වීම.
   මූර්ත පොලී අනුපාතය = නාමික පොලී අනුපාතය - උද්ධමන වේගය
2. ණයහිමියන්ට අවාසිදායක වන අතර ණයගැතියන්ට වාසි සිදු වේ.
3. ස්ථාවර ආදායම් ලබන්නාගේ මූර්ත ආදායම පිරිහෙන අතර, විචල්‍ය ආදායම් ලබන්නාගේ මූර්ත ආදායම වැඩි වේ.
4. ආදායම් ව්‍යාප්තියේ විෂමතාව ඉහළ යයි.
5. අපනයන තරඟකාරීත්වයට බාධා පැමිණීම සිදු වේ.
6. පුද්ගල ජීවන වියදම ඉහළ යයි.
7. නිරපේක්ෂ දරිද්‍රතාවය ඉහළ යයි.

විනිමය අනුපාතය ක්ෂය වේ.

උද්ධමනය පාලනය කිරීම සඳහා ගත හැකි ප්‍රතිපත්තිමය ක්‍රියා මාර්ග

රජයකට උද්ධමනය පාලනය කිරීම සඳහා පහත ක්‍රියාමාර්ග ගත හැකිය.

1. සමහාර ඉල්ලුමේ වර්ධනය සීමා කිරීම.
2. සමාහාර සැපයුමේ වර්ධනය වේගවත් කිරීම.
3. කාර්යක්ෂම සම්පත් බෙදාහැරීමෙහි ලා පවතින බාධා ඉවත් කිරීම.

- **ප්‍රශ්න පොතට**

1. භාණ්ඩ හුවමාරු ක්‍රමයේ දුර්වලතා කවරේද?
2. මුදලේ කාර්යයන් සැකෙවින් දක්වන්න.
3. හොඳ මුදලක ලක්ෂණ 03 ක් දක්වන්න.
4. මුදල් සඳහා ඇති ඉල්ලුමේ චේතනා 03 පැහැදිලි කරන්න.
5. මුදල් සැපයුම යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.
6. පුළුල් මුදල් සැපයුමට අයත් සංරචක කවරේද?
7. ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම, පටු මුදල් සැපයුමෙන් වෙනස් වන්නේ කෙසේද?
8. ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් කිහිපයක්
9. මූල්‍ය අතරමැදි ආයතන ඉටු කරන කාර්යභාරය පැහැදිලි කරන්න.
10. මූල්‍ය ප්‍රතිපත්තිය කෙටියෙන් පහදන්න.
11. ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාලන උපක්‍රම කවරේද?
12. ශ්‍රී ලංකා මහ බැංකුවේ ගුණාත්මක පාලන විධි කිහිපයක් දක්වන්න.
13. උද්ධමනයක ප්‍රතිවිපාක 05 ක් දක්වන්න.
14. උද්ධමනයට හේත කවරේද?
15. ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය ප්‍රස්ථාරයක් සහිතව පැහැදිලි කරන්න.
16. පිරිවැයෙන් තල්ලු වුණු උද්ධමනය කෙටියෙන් පැහැදිලි කරන්න.
17. උද්ධමනය අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග කවරේද?

JMC vLearning
© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd